සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

# 13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2026
## தரம் 13 ஆண்டிறுதிப் பரீட்சை - 2026 / Grade 13 Final Term Test - 2026

කෘෂි විද්‍යාව I
Agricultural Science I

08 S 1

කාලය / நேரம் / Time } පැය දෙකයි

නම / பெயர் / Name } ..........................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ..........................

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 50 තෙක් ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

1. නැකැත් වේලාවන් හා අධ්‍යාත්මික බලය වගා කටයුතු සඳහා යොදා ගැනෙන ගොවිතැන් ක්‍රමයක් වන්නේ ,
   1. සමෝධානිත ගොවිතැන 2. කාබනික ගොවිතැන 3.වර්ෂා පෝෂිත වගාව
   4. ජෛව ගතික ගොවිතැන 5. සංරක්ෂිත ගොවිතැන

2. ස්ටීවන්සන් ආවරණය පිළිබද ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
   A – මෙම උපකරණය කාලගුණය මනින උපකරණයක් නොවේ.
   B – සාමාන්‍ය උෂ්ණත්වමානය , ආර්ද්‍රතාමානය හා පාංශු උෂ්ණත්වමානය මෙය තුළ තබා ඇත.
   C - පොළොව මට්ටමේ සිට 1.5 m ඉහළින් සවිකර ඇත.
   ඉහත ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශ/ ප්‍රකාශය වන්නේ ,
   1. A පමණි. 2. B පමණි. 3. C පමණි. 4. A හා C පමණි. 5. B හා C පමණි.

3. කාලගුණික පද්ධතිවල අඩු පීඩන ප්‍රදේශයක් සුළිසුළඟක් දක්වා වර්ධනය වීමට ,
   1. සාගර උෂ්ණත්වය $27^0C$ ට වඩා අඩු විය යුතුය.
   2. සුළඟේ වේගය පැයට කිලෝමීටර් 28 – 60 ත් අතර විය යුතුය.
   3. සිරස් දිශාවේ විවිධ මට්ටම් අතර සුළඟේ වේගය හා දිශාව වෙනස් වීම ඉතා අඩුවිය යුතුය.
   4. කොරියෝලිස් බලය ශුන්‍යයට ආසන්න විය යුතුය.
   5. සෑම දිශාවකින්ම සුළං හැමිය යුතුය.

4. ලවණ පසක් ඇතිවීමට වැඩි බලපෑමක් ඇති කරනු ලබන ක්‍රියාවලියක් වන්නේ,
   1. අධික වර්ෂාපතනය 2. අම්ල වැසි ඇති වීම. 3. මුහුද ගොඩ ගැලීම.
   4. අඩු උෂ්ණත්වය හේතුවෙන් කාබනික ද්‍රව්‍ය දුර්වලව වියෝජනය වීම.
   5. $(NH_4)_2SO_4$ වැනි පොහොර දීර්ඝ කාලයක් තිස්සේ දිගින් දිගටම භාවිතා කිරීම.

5. පාංශු පැතිකඩේ B කලාපය පිළිබද වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ ,
   1. කාබනික ද්‍රව්‍ය සාපේක්ෂව වැඩි ප්‍රමාණයක් අඩංගුය.
   2. සංචායක කලාපය ලෙස හඳුන්වයි.
   3. පාෂාණ ජීර්ණය ආරම්භ වන කලාපයයි.
   4. පාෂාණ මාතෘ ද්‍රව්‍ය බවට පරිණාමනය වන කලාපයයි.
   5. පාංශු ක්ෂුද්‍ර ජීවීන් බහුලව වාසය කරන කලාපයයි.

6. මැටි ඛනිජ සම්බන්ධයෙන් ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
   A – මැටි අංශුවක් 0.002 mm ට වඩා විෂ්කම්භයෙන් අඩුය.
   B – මැටි ඛනිජ අංශු ජලීය ද්‍රාවණයක් තුළ අවලම්භනය වේ.
   C - මැටි ඛනිජ ප්‍රාථමික වශයෙන් සෘණ ආරෝපණ දරයි.
   ඉහත ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශ / ප්‍රකාශය වන්නේ ,
   1. A පමණි. 2. A හා B පමණි. 3. B හා C පමණි.
   4. A හා C පමණි. 5. A , B, C සියල්ලමය.

7. පසක මුළු පරිමාව 150 $cm^3$ වන අතර එම පසේ ඝන ද්‍රව්‍ය වල පරිමාව 40 $cm^3$ හා වාතයේ පරිමාව 80$cm^3$ කි. මෙම පසේ සච්ඡිද්‍රතාව වන්නේ ,
   1. 26%  2. 53.3 %  3. 73.3 %  4. 80%  5. 100%

8. පහත මූලද්‍රව්‍ය අතරින් මහා මූලද්‍රව්‍ය යටතට ගැනෙන අචල පෝෂකයක් වන්නේ ,
   1. Ca  2. B  3. Mg  4. Cl  5. N

9. පොස්පරස් ද්‍රව්‍යතාව වැඩිකරන ජෛව පොහොර නිපදවීමට භාවිතා කරන දිලීරයක් වන්නේ ,
   1. Azotobacter  2. Pseudomonas  3. Bacillus Spp
   4. Aspergillus  5. Azospirillium

10. බඩ ඉරිගු වගාවක ළපටි පත්‍ර ලා කොළ පැහැයට හැරී පත්‍ර නාරටි කහ පැහැ වී තිබෙනු දක්නට ලැබුනි. මෙම ලක්ෂණ වලට හේතුවන වගාවට ඌන වී ඇති පෝෂකය වනුයේ ,
   1. Mg  2. S  3. Fe  4. Cu  5. Zn

11 සහ 12 ප්‍රශ්න සඳහා

• බෝග වගාව සඳහා බිම් සැකසීමේදී සිදු කරන ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

A – පසට පොහොර මිශ්‍ර කිරීම.
B – විශාල පස් කැට පොඩි කිරීම.
C – විශාල කැට සහිත පාංශු මතුපිටක් ඇති කිරීම.
D – පස සමතලා කිරීම.
E – ගස වටා ඇති පස බුරුල් කිරීම.

මෙම ක්‍රියාකාරකම් අතුරින් ,

11. ද්විතියික බිම් සැකසීමේදී සිදු කරන ක්‍රියාකාරකම් පමණක් අඩංගු පිළිතුර වනුයේ,
   1. A හා B  2. B හා C  3. B හා D  4. A හා C  5. C හා E

12. අතුරුයත් ගෑමේ ක්‍රියාවන් පමණක් අඩංගු පිළිතුර වනුයේ ,
   1. A හා C  2. B හා E  3. C හා D  4. A හා E  5. D හා E

13. වී වගාවේදී අනුගමනය කරන "මඩ කිරීම" යන විශේෂිත බිම් සැකසීමේ පියවර මගින් ,
   1. පාංශු ව්‍යුහය දියුණු කෙරේ.
   2. පසේ උප ස්ථරයට අපාරගම්‍ය ස්ථරයක් ඇති කරයි.
   3. ජලවහනය වැඩි දියුණු කරයි.
   4. පාංශු වයනය දියුණු කරයි.
   5. පස ස්වායු තත්ත්වයේ පවත්වා ගනී.

14. මෙම රූප සටහනින් දැක්වෙන ජල එසවීමේ උපකරණ හඳුන්වනු ලබන්නේ ,



   1. පැද්දෙන යොත ලෙස ය.
   2. අඩියා ලිද ලෙස ය.
   3. ප්‍රතිතෝලක එසවුම ලෙස ය.
   4. පැද්දෙන ගොටුව ලෙස ය.
   5. දිය රෝදය ලෙස ය.

15. පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රමයක් වන බෙසම් ජල සම්පාදන ක්‍රමය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   1. ලවණතාවය අධික පසක ලවණතාව ඉවත් කිරීමට වුවද යොදාගත හැක.
   2. කාන්දුවීමේ ශීඝ්‍රතාව අධික නම් බෙසමේ ප්‍රමාණය වැඩි කළ යුතුය.
   3. ජලය අපතේ යාම ඉතා අඩුය.
   4. ඕනෑම බෝගයකට යොදා ගත හැක.
   5. ඉහළ තාක්ෂණික දැනුමක් අවශ්‍ය වේ.

16. මෙම රූප සටහනේ දැක්වෙන ජලවහන කාණු පද්ධති සැලසුම වනුයේ,




   1. සමාන්තර කාණු පද්ධතිය කි.
   2. ග්රිඩ්අයන් කාණු පද්ධතිය කි.
   3. හෙරින්බෝන් කාණු පද්ධතිය කි.
   4. අහඹු කාණු පද්ධතිය කි.
   5. ද්වි රේඛිය ක්‍රමය යි.

17. ඒක ලිංගික පුෂ්ප දරණ ද්විගෘහි ශාකයට උදාහරණයක් වනුයේ ,
1. වට්ටක්කා
2. තුඹ කරවිල
3. බඩ ඉරිඟු
4. තක්කාලි
5. බණ්ඩක්කා

18. මෙම බද්ධ ක්‍රමය වනුයේ ,
1. සෑදල බද්ධය
2. ජිහ්වා බද්ධය
3. කිරුළු බද්ධය
4. ආරුක්කු බද්ධය
5. පැති බද්ධය



19. බීජ සාම්පලයක තෙතමන ප්‍රතිශතය සෙවීම සඳහා පහත දත්ත ලබා ගන්නා ලදි.
- බීජ සාම්පලයේ මුල් බර = 60 g
- 105 $^{0}$C උෂ්ණත්වයේ නියත බරක් ලැබෙන තුරු රත් කල විට බර = 55 g

මෙහි තෙතමන ප්‍රතිශතය වනුයේ,
1. 8.33 %
2. 9.09 %
3. 9.1 %
4. 10 %
5. 91 %

20. පරාගනය හා සංසේචනය සම්බන්ධ පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශනය වනුයේ ,
1. පරාග මාතෘ සෛල ඌනන විභාජනයට ලක් වී ක්ෂුද්‍ර බීජාණු හතරක් සාදයි.
2. ක්ෂුද්‍ර බීජාණු පරාග කණිකාවක් බවට පත් වීමේදී ඒක ගුණ න්‍යෂ්ටිය බෙදී ජනක න්‍යෂ්ටි දෙකක් බවට පත් වේ.
3. ඕනෑම අවස්ථාවකදී කලංකය පරාග කණිකා සඳහා ග්‍රාහී වේ.
4. පරාග කණිකා කලංකය මත ප්‍රරෝහණය වී ජනක න්‍යෂ්ටිය කීලය දිගේ වැඩී ඩිම්බයට සම්බන්ධ වේ.
5. පරාග කණිකාවේ ජනක න්‍යෂ්ටිය සංසේචනයට පෙර නැවත බෙදී පුං න්‍යෂ්ටි හතරක් සාදයි.

21. බිත්තර වී නිෂ්පාදන වැඩ පිළිවෙළහි පියවර නිවැරදිව දක්වා ඇත්තේ ,
1. අභිජනන බීජ - ලියාපදිංචි බීජ - අත්තිවාරම් බීජ - සහතික කළ බීජ
2. අත්තිවාරම් බීජ - අභිජනන බීජ - ලියාපදිංචි බීජ - සහතික කළ බීජ
3. අභිජනන බීජ - අත්තිවාරම් බීජ - ලියාපදිංචි බීජ - සහතික කළ බීජ
4. ලියාපදිංචි බීජ - අත්තිවාරම් බීජ - අභිජනන බීජ - සහතික කළ බීජ
5. අභිජනන බීජ - අත්තිවාරම් බීජ - සහතික කළ බීජ - ලියාපදිංචි බීජ

22. ප්‍රභාසංස්ලේෂණයේ අඳුරු ප්‍රතික්‍රියාව සිදුවන්නේ ,
1. ශාක සෛලයේ හරිතලව ඇතුල් පටලයේය.
2. ශාක සෛලයේ හරිතලව පංජර කණිකා තුළය.
3. ශාක සෛල හරිතලව පංජරය තුළය.
4. ශාක සෛල මයිටකොන්ඩ්‍රියා පූරකය තුළය.
5. ශාක සෛලයේ සෛල ප්ලාස්මය තුළය.

23. ශ්වසන ක්‍රියාවලියට බලපාන බාහිර සාධකයක් වන $O_2$ සාන්ද්‍රණය හා ශ්වසන වේගය අතර සම්බන්ධතාව නිවැරදිව දැක්වෙන ප්‍රස්ථාරය වනුයේ ,

1.


2.


3.


4.


5.


24. ශාක අභිජනන කටයුතු සඳහා වරණය යොදා ගැනීමේදී ,
   1. කෙටි කාලයක් තුළ අදාල ලක්ෂණය වැඩි දියුණු කරයි.
   2. ජනිත පරම්පරාවට සමයුග්මක ප්‍රමුඛ ජාන පථ සංඛ්‍යාවක් ලබා දීම මගින් අදාල ලක්ෂණය වැඩි දියුණු කරයි.
   3. ගහනය තුළ සහාභිජනනය වළක්වාලීම සිදුකරයි.
   4. දෙමුහුම් අභිජනනය සිදුකිරීමෙන් ලක්ෂණය වැඩි දියුණු කරයි.
   5. තාක්ෂණික දැනුම වඩාත් අවශ්‍ය බැවින් ශාක වැඩි දියුණු කිරීම අපහසුය.

25. ආරක්ෂිත ගෘහ තුළ බිත්ති සඳහා පොලිතීන් වෙනුවට කෘමි ආරක්ෂිත දැල් භාවිත කිරීමේ අරමුණ වන්නේ ,
   1. සෙවන ඇති කිරීම හා එමගින් උෂ්ණත්වය පාලනය කිරීම ය.
   2. වාතනය දියුණු කිරීම මගින් ආර්ද්‍රතාවය පාලනයට ය.
   3. සියළු පළිබෝධකයින් ගෙන් ආරක්ෂා කිරීමට ය.
   4. උමඟ තුළ වාතය උණුසුම් වීම වළක්වාලීමටත් කෘමීන් ගෘහය තුළට ඇතුළු වීම වළක්වාලීමටත්ය.
   5. කෘමීන් ගෘහය තුළට ඇතුළු වීම වළක්වාලීමට හා සෙවන තත්ත්ව ලබා දීමටය.

26. නිර්පාංශු වගාවේ පෝෂක ද්‍රාවණ භාවිතා කරන මුල් ගිල්වූ වගා ක්‍රමයේ දී කළු පොලිතීන් කොළයක් අතුරන්නේ,
   1. ද්‍රාවණයේ උෂ්ණත්වය පාලනයට ය.
   2. ද්‍රාවණයට ආලෝකය උරාගැනීමට ය.
   3. දියර කාන්දු වීම වළක්වාලීම හා අඳුරු තත්ත්වයක් ලබා දීමට.
   4. ශාකයේ මුල් වර්ධනය උත්තේජනය කිරීමට.
   5. ක්ෂුද්‍ර ජීවින්ගේ ක්‍රියාකාරිත්වය අවම කිරීමෙන් රෝග ආසාදන වැළැක්වීමට.

- පහත දැක්වෙන වල් පැළෑටි ඇසුරින් 27 සිට 29 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
  A – Vernonia cinera B – Monochoria vaginalis C – Lantana camara
  D – Cymbopogon conifertiflorus E – Cyperus rotundus

27. මේ අතරින් වාර්ෂික හා ජලජ වල් පැළෑටියක් පිළිවෙලින් දක්වා ඇත්තේ ,
   1. A හා B ය. 2. B හා C ය. 3. C හා D ය. 4. C හා E ය. 5. D හා E ය.

28. තෘණ හා පන් වර්ගයට අයත් වල් පැළෑටි පිළිවෙලින් දක්වා ඇත්තේ,
   1. A හා D 2. B හා E 3. C හා D 4. D හා E 5. A හා E

29. මීන් ආක්‍රමණශීලි වල් පැළෑටියක් වනුයේ ,
   1. A ය. 2. B ය. 3. C ය. 4. D ය. 5. E ය.

30. කුඹුරක ගොයම් ශාක නිරීක්ෂණ කළ ගොවි මහතෙකුට දක්නට ලැබුණු හානියේ ස්වභාවය පහත දැක්වේ.
   - වී ශාකයේ පත්‍ර දාර එකට බැඳ නාළාකාර කොපුවක් සාදා තිබීම හා එම පත්‍ර මධ්‍යයේ පටක තීරු වශයෙන් සූරා කා තිබීම.

   මෙම හානිය සිදු කරන පළිබෝධක කෘමියා විය හැක්කේ ,
   1. කහපුරුක් පණුවා ය. 2. ගොයම් කොළ හකුළුවන දළඹුවා ය. 3. ගොයම් මකුණා ය.
   3. ගොක් මැස්සා. 5. පස් මුළු මකුණා.

31. ශාක රෝග පැතිරීම විවිධ ක්‍රම වලට සිදුවන අතර පසෙන් බෝ වන රෝග පමණක් අඩංගු පිළිතුර වනුයේ ,
   1. තේ බිබිලි රෝගය, කෝපි මලකඩ රෝගය, අර්තාපල් අංගමාරය.
   2. හිටු මැරීම, තක්කාලි විචිත්‍ර රෝගය, කෙසෙල් වද පිදීම.
   3. පැපොල් මුදු පුල්ලි රෝගය, දියමලන්කැම, අංගමාරය.
   4. කොළ කොඩ වීම, හිටු මැරීම, තේ බිබිලි රෝගය.
   5. හිටු මැරීම, දියමලන් කැම, තේ මුල් ගැට රෝගය.

32. මානව පෝෂණයේදී වැදගත් වන ප්‍රෝටීන සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ ,
   1. ප්‍රධාන කාර්යය ශක්තිය නිපදවීම වන අතර දෛනික කැලරි අවශ්‍යතාව මෙමගින් සැපයේ .
   2. C , H හා O යන මූලද්‍රව්‍ය වලින් පමණක් සමන්විතය.
   3. සත්ත්ව ප්‍රෝටීනවල ජෛව විද්‍යාත්මක අගය වැඩි අතර ශාක ප්‍රෝටීනවල ජෛව විද්‍යාත්මක අගය අඩුය.
   4. ශරීරය තුළ කොලොස්ටෙරෝල් නිෂ්පාදනයට දායක වේ.
   5. ප්‍රතිඔක්සිකාරක ගුණයක් ඇත.

33. පහත දැක්වෙන ප්‍රමිති අතරින් පද්ධති ප්‍රමිති පමණක් අඩංගු පිළිතුර වනුයේ,
1. HACCP , SLS , ISO
2. GMP , GAP , HACCP
3. HACCP , GAP , ISO
4. GAP , SLS , ISO
5. SLS , ISO , GMP

34. ඇසුරුම් වර්ගීකරණයට අනුව ඇසුරුම් තුළ ඇති තත්ත්වය අනුව ඇසුරුම් වර්ගය නම් කරනුයේ ,
1. රික්තක ඇසුරුම ලෙසය.
2. පාරිභෝගික ඇසුරුම ලෙසය.
3. ප්‍රාථමික ඇසුරුම ලෙසය.
4. ප්‍රවාහන ඇසුරුම ලෙසය.
5. නම්‍යශීලී ඇසුරුම ලෙසය.

35. ක්ෂීරපායින්ගේ පිළිකා ඇති කිරීම , අක්මා පටකවල වෙනස්කම් ඇති කිරීම මෙන්ම ආසාත්මිකතාව මගින් මරණය පවා සිදුවිය හැකි ආහාර විෂවීමට හේතුවන ක්ෂුද්‍ර ජීවියා වනුයේ ,
1. Salmonella typhi
2. Vibrio cholera
3. Clostridium botulinum
4. Pseudomonas fluorescens
5. Aspergillus flavus

36. විවිධ බෝගවල පරිණත දර්ශකය නිර්ණය කරන ක්‍රමවේද සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. ඇඹුල් කෙසෙල් පළමු ඇවරිය හටගත් දින සිට සති 15 කින් විදේශීය වෙළඳපොළට නිකුත් කරයි.
2. පරිණත අඹ ජලයේ පාවෙන අතර අපරිණත අඹ ජලයේ ගිලෙයි.
3. පේර ලා කොළ පැහැයේ සිට තද කොළ පැහැයට වර්ණය වෙනස්වන අවස්ථාව පරිණත අවස්ථාව ලෙස සැලකේ.
4. කෙසෙල් ගෙඩිවල කෝණාකාර බව නැති වී රවුම් ගතියට පත්වන අවස්ථාව කෙසෙල්වල පරිණත අවස්ථාවයි.
5. ඵලයේ වර්ණය දම් පැහැයේ සිට දුඹුරු පැහැය දක්වා වෙනස්වන අවස්ථාව මැංගුස්ටින්වල පරිණත අවස්ථාවයි.

37. පසු අස්වනු හානියට බලපාන කායික විද්‍යාත්මක සාධකයක් වන්නේ ,
1. උත්ස්වේදනය
2. වායුගෝලීය සංයුතිය
3. තැලීම් හා තුවාලවීම්
4. කෘමි පළිබෝධ හානි
5. කාලගුණික සාධක

38. ගොවිපොළ සතුන්ට වැළඳෙන රෝග අතරින් එන්නත් භාවිත කර පාලනය කිරීමට වඩාත් යෝග්‍ය රෝග කාණ්ඩය වනුයේ ,
1. රැනිකට්, කිරිඋණ, කුර හා මුඛ රෝගය යි.
2. කොක්සිඩියෝසිස්, ගව රක්තාශ්‍රවය, මැස්ටයිටිස්
3. බඩ පිපුම, රැනිකට්, කුර හා මුඛ රෝගයයි.
4. රැනිකට්, ගම්බෝරෝ, කුර හා මුඛ රෝගය යි.
5. ගම්බෝරෝ, කිරිඋණ, රැනිකට්

39. ඉහළ බිත්තර නිෂ්පාදනයක් සහිත කිකිළියන්ගේ තිබිය යුතු ලක්ෂණයක් වන්නේ ,
1. පිහාටු මනාව වැඩී තිබීම.
2. කෙණ්ඩාවල හා හොටයේ වර්ණක විරංජනය වීම අඩුය.
3. හොට හා නියපොතු දිගය, ගෙවීගිය ස්වභාවය අඩුවීම.
4. ජම්බාලිය කුඩාය, වියළිය, රළු ගතියකින් යුක්තය.
5. උකුල් අස්ථි දෙක අතර පරතරය වැඩිය. ඇඟිලි 3 - 4 තැබිය හැකි වීම.

40. ගවයාගේ සංකීර්ණ ආමාශය පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,
1. රුමනය තුළ පවත්වා ගන්නා pH අගය 7.5 -8.5 අතර වේ.
2. රුමනයට ඇතුළු වූ සැනින් ආහාර විතංශිකාව වෙතට යොමු කරයි.
3. රුමනය හා බහුනැමිය අතර ඇති අන්නස්‍රෝත ඇළිය පැටවුන්ට කිරි ජඨරාශය වෙතට යොමු කිරීමට උපකාරී වේ.
4. විතංශිකාව හෘදයට ඉතා ආසන්නව මහා ප්‍රාචීරයෙන් වෙන්ව පවතී.
5. බහු නැමිය එක් පසකින් රුමනයටත් අනෙක් පසින් ජඨරාශයටත් විවෘත වේ.

41. කුකුළාගේ ආහාර ජීර්ණයේදී ,
1. මුඛය තුළ දී ඛේට ශ්‍රාවය මගින් ජීර්ණ ක්‍රියාවලිය ආරම්භ වේ.
2. ගොජුර තුළ දී ආහාරයට ජීර්ණක එන්සයිම එකතු වේ.
3. පූර්ව ආමාශය තුළ දී ආහාර යාන්ත්‍රික ජීර්ණයට ලක්වෙයි.
4. චාර්වකයේ සිදුවන රිද්මයානුකූල චලන ආහාර ජීර්ණයට වැදගත් වේ.
5. මහාන්ත්‍රය, ගුද මාර්ගය මගින් පිටතට විවෘත වේ.

42. කෘත්‍රිමව බිත්තර රක්කා වීමේ දී කැබිනට් ආකාරයේ බිත්තර රක්කවන යන්ත්‍රයක ඇසුරුම් කුටීරයේ සිට පැටවු රක්කවන කොටසට බිත්තර මාරු කළ යුත්තේ කොපමණ දින ගණනකින්ද?
1. 7 න්
2. 14 න්
3. 16 න්
4. 18 න්
5. 21 න්

43. කෘත්‍රිම සිංචන ක්‍රියාවලිය සිදුකිරීමේ දී ,
1. ග්‍රාමීය මට්ටමේ දෙනුන් ගැබ් ගැන්වීමට ශීත ශුක්‍රාණු වඩාත් යෝග්‍යය.
2. දෙනගේ මද ලක්ෂණ පහළ වී පැය 18 ට පසු සිංචනය සඳහා යොදා ගනියි.
3. ශුකාණු තැන්පත් කිරීම භගය ආසන්නයේ දී සිදුකළ යුතුය.
4. ශුක්‍ර මඩි 32 $^0C$ උෂ්ණත්වයට පත්වූ පසු සිංචනය සඳහා යොදාගත යුතුය.
5. දෙනගේ යෝනි මාර්ගය ඔස්සේ සිංචන ශිල්පියාගේ එක් අතක් ඇතුල් කර කෘත්‍රිම සිංචන තුවක්කුව උපයෝගී කරගෙන ශුකාණු ඇතුල් කළ යුතුය.

44. කිරිවල ගුණාත්මකබව පරීක්ෂා කිරීමේදී කිරිවලට ග්ලිසරින් එකතු කලවිට කිරි රතු පැහැයක් ගන්නේ නම්, එයට එකතු කර ඇති ද්‍රව්‍ය වනුයේ ,
1. ජලය 2. ලුණු 3. සීනි 4. ෆෝමලින් 5. පාන්පිටි

45. පහත ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරන්නේ කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගන්නා X හා Y සාධකවල සංයෝජනයන්ය.




මෙහි X හා Y සඳහා වඩාත් ගැළපෙන සංයෝජනය වනුයේ පිළිවෙලින්,
1. පාන් හා බනිස්
2. පොහොර හා අස්වැන්න
3. කැරට් හා ගෝවා
4. ශ්‍රමය හා පොහොර
5. මිල හා සහල් මිලදී ගත හැකි ප්‍රමාණය

46. යම් භාණ්ඩයක් සඳහා ඉල්ලුම් හා සැපයුම් වක්‍ර සමාන ලෙස විතැන් වුනි නම්,
1. වෙළඳපොළ සමතුලිත මිල වැඩිවේ.
2. වෙළඳපොළ සමතුලිත මිල අඩු වේ.
3. සමතුලිත ප්‍රමාණය පමණක් වෙනස් වේ.
4. සමතුලිත ප්‍රමාණය වෙනස් නොවේ.
5. සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය යන දෙකම වෙනස් නොවේ.

47. කෘෂි ව්‍යාපාර පවත්වාගෙන යාමේදී කළමණාකරණ ක්‍රියාවලිය වැදගත් වේ. මෙම ක්‍රියාවලියේ මූලික ක්‍රියාවන් වන්නේ
1. නිෂ්පාදනය, තොග එකතු කිරීම, ශ්‍රේණි කිරීම, අලෙවිය
2. කළයුතු කාර්යයන් හඳුනාගැනීම, සංවිධානය, සම්පත් බෙදා හැරීම.
3. භෞතික සම්පත් රැස්කිරීම, ශ්‍රම විභාජනය, මෙහෙයවීම, නිෂ්පාදනය
4. සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම, පාලනය කිරීම
5. සැලසුම් කිරීම, නිෂ්පාදනය, තොග රැස් කිරීම, අලෙවිය

48. අතුරු බෝග වගාව පිළිබඳ සත්‍ය ප්‍රකාශනය වන්නේ ,
1. යාන්ත්‍රිකරණ කටයුතු පහසුවෙන් සිදුකළ හැකිය.
2. අවශ්‍ය ප්‍රාග්ධනය අඩුය.
3. පශ්චාත් සාත්තු කිරීමේ කටයුතු පහසුය.
4. අස්වනු නෙළීමේ කටයුතු වඩාත් පහසුය.
5. භූමිය ආවරණය වීම මගින් පාංශු ජලය සංරක්ෂණය වීම සිදු වේ.

49. කෘෂිකර්මාන්තය ආශ්‍රිත බහුල සංක්‍රමණික රෝගයක් වන මී උණ (Leptospirosis) රෝගය පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ ,
1. මිනිසාට වැළදෙන්නේ මීයන්ගෙන්ම පමණි.
2. රෝගකාරකයා කුඹුරේ පමණක් වාසය කරයි.
3. ශ්වසන පද්ධතිය හරහා පමණක් රෝග කාරකයා මිනිස් සිරුරට ඇතුළු වේ.
4. බැක්ටීරියාවක් මගින් රෝග ආසාදන තත්ත්ව ඇතිකරයි.
5. උණ, පපුවේ වේදනාව හා කැස්ස ප්‍රධාන රෝග ලක්ෂණ වේ.

50. හරිතාගාර වායු වන්නේ ,
1. $CO_2$ , $NO_2$ , $NH_3$ 2. $CO_2$ , $N_2O$ , $NH_3$ 3. $CO_2$ , $NH_4$ , $CH_4$
4. $CO_2$ , $N_2O$ , $CH_4$ 5. $CO_2$ , CFC , $NH_3$